සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **7 ශ්‍රේණිය**
முதலாம் தவணைப் பரீட்சை 2018 தரம் 7
**First Term Test 2018** **Grade 7**

**භූගෝල විද්‍යාව I II** **පැය දෙකයි**
**புவியியல் I II** **இரண்டு மணித்தியாலம்**
Geography **I II** ***Two hours***

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

01. පෘතුවියට තම අක්ෂය වටා වරක් ගමන් කිරීමට (පෘතුවි භ්‍රමණයට) ගත වන කාලය ආසන්න වශයෙන්

01. දින 24 කි. 02. පැය 28 කි.
03. දින 365 කි 04. පැය 24 කි.

02. පෘතුවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර මිලියන

01. 520 කි 02. 565 කි
03. 510 කි 04. 610 කි

03. පෘතුවි ආදර්ශ ගෝලය වටා නැගෙනහිර සිට බටහිරට තිරස් අතට විහිදෙනුයේ

01. දේශාංශ රේඛාව 02. මධ්‍යහ්න රේඛාව
03. අක්ෂාංශ රේඛාව 04. සමෝෂ්ණ රේඛාව

04. ග්‍රිනිච් මධ්‍ය දේශාංශයේ සිට නැගෙනහිරට ඇත්තේ

01. බටහිර දේශාංශය යි 02. නැගෙනහිර දේශාංශය යි
03. නැගෙනහිර අක්ෂාංශ යි 04. බටහිර අක්ෂාංශ යි

05. ගොඩබිමින් සම්පූර්ණයෙන් ම වට වූ කැස්පියන් මුහුද පිහිටා ඇති මහද්වීපය

01. ආසියාවයි 02. යුරෝපයයි
03. ඕස්ට්‍රේලියාවයි 04. අප්‍රිකාවයි

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා හිස්තැනට අදාල පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

06. සාගර ජලයෙන් වට වූ විශාල ගොඩබිම............................නම් වේ.

07. .................................. මහද්වීපයක් වූ තනි රටකි.

08. මහද්වීප අතර පිහිටි විශාල ජලතල ප්‍රදේශ ........................... ලෙස හැඳින්වේ.

09. ජලයෙන් වට වූ කුඩා ගොඩබිම .................................... නමින් හැඳින්වේ.

10. ලෝකයේ විශාලතම දූපත ................................... යි

( ඕස්ට්‍රේලියාව, ග්‍රීන්ලන්තය,මහදවීපය,සාගර,දූපත)

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද වරහන් තුළ ලියන්න

11. පෘතුවියේ සමක පරිධිය ධ්‍රැවක පරිධියට වඩා අඩුය. (...............)
12. දේශාංශ 180 රේඛාව පදනම් කොට ගෙන ජාත්‍යන්තර දින රේඛාව ලකුණු කොට ඇත. (..............)
13. ශ්‍රී ලංකාවට උතුරින් ඕස්ට්‍රේලියා මහද්වීපය පිහිටා ඇත. (.............)
14. ආසන්න වටපිටාව පදනම් කරගෙන සාපේක්ෂ පිහිටීම දක්වයි. (..............)
15. පෘතුවි පෘෂ්ඨයෙන් ජලයෙන් වැසී ඇති ප්‍රමාණය 29 % කි. (...........)

- අංක 16 සිට 20 දක්වා A කොටසට ගැලපෙන පිළිතුර B කොටසකින් තෝරා යා කරන්න


| A කොටස | B කොටස |
|---|---|
| 16. ශ්‍රී ලංකාවේ බටහිර හා නිරිත දිග ප්‍රදේශ වලට මෙමගින් අධික වැසි ලැබේ. | සංවහන වර්ෂා |
| 17. උතුරු නැගෙනහිර ප්‍රදේශ අධික වැසි ලබන වර්ශන ක්‍රමයයි | වාසුලි වර්ෂා |
| 18. වසර පුරා ක්‍රියාත්මක වන ගිගුරුම් සහිත වර්ශාවකි. | ඊසාන දිග මෝසම් |
| 19. ඔක්තොම්බර්- දෙසැම්බර් බෙංගාල බොක්ක ආශ්‍රිත ක්‍රියාත්මක වේ | මෝසම් |
| 20. කාලීන සුළං ධාරා මෙනමින් හැඳින්වේ | නිරිත දිග මෝසම් |

# 11 පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- පළමු වන ප්‍රශ්නය ඇතුලත්ව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5 කි.

01. සපයා ඇති ලෝක ආකෘති සිතියෙමෙහි පහත දී ඇති ස්ථාන ලකුණු කොට නම් කරන්න.


i) පෝක් සමුද්‍ර සන්ධිය
ii) අත්ලන්තික් සාගරය
iii) ආසියා මහද්වීපය
iv) සමකය
v) මැඩගස්කරය
vi) මධ්‍යධරණී මුහුද




ල. 2 x 6 = 12

02)

(i) පහත දී ඇති රූප සටහන නිරීක්ෂණය කොට ආදර්ශ ගෝලයේ ලකුණු කොට ඇති A,B,C අක්ෂාංශයන්හි නම් ලියන්න ( ල. 03 )




(ii). "පෘතුවි හැඩය ගෝලාකාර වුවද එය පූර්ණ ගෝලයක් නොවේ" ( ගණිතයම) පැහැදිලි කරන්න.

(ල. 04)

(iii). දේශාංශ රේඛා යනු මොනවාදැයි හදුන්වා ප්‍රධාන දේශාංශ රේඛා 02 ක් නම් කොට ඉන් 1ක් කෙටියෙන් හඳුන්වන්න.

(ල. 05)

03).

(i). විශාලත්වය අනුව ප්‍රධාන මහද්වීප 3 පිළිවෙලින් ලියන්න. (ල. 03)

(ii). ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටා ඇති දූපත් 4ක් ලියන්න (ල. 04)

(iii). සාගර වලට සම්බන්ධ වු මුහුදු තුනක් හා රට අභ්‍යන්තරයේ පිහිටි මුහුදු දෙකක් නම් කරන්න. (ල. 05)

04).


(i). සාපේක්ෂ පිහිටීම යනු කුමක්දැයි හඳුන්වන්න.

(ල. 03)

(ii).පහත දි ඇති සිතියම නිරීක්ෂණය කර පිළිතුරු සපයන්න.


- A සිට B ස්ථාන නම් කරන්න
- A සිට B දක්වාත්
- C සිට D දක්වාත් ඇති දුර ලියන්න.

(ල. 04)




(iii).ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ලැබී ඇති වාසි 2 ක් පැහැදිලි කරන්න (ල. 05)

05)




.

ඉහත දක්වන ලද දිවයිනේ ප්‍රධාන භූ විෂමතා කලාප (සිතියම අධ්‍යයනය කොට)

(i). දිවයිනේ ප්‍රධාන භූ විෂමතා කලාප 3 නම් කරන්න (ල. 03)

(ii). වෙරළ බඩ තැනිතලාවෙහි දැකිය හැකි භූ විෂමතා ලක්ෂන 4ක් නම් කරන්න (ල. 04)

(iii). ශ්‍රී ලංකාවේ පවතින භූ විෂමතා හා දේශගුණික විවිධත්වය සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට සමත් වී ඇති බවට නිදසුන් 2ක් ඇසුරින් කරුණු දක්වන්න (ල. 05)

06).

(i). ශ්‍රී ලංකාව නිවර්තන කලාපයෙහි පිහිටි රටකි එහි වාර්ෂික උෂ්ණත්වය සහ පිහිටීමේ වාසි 2ක් ලියන්න (ල. 03)

(ii). ශ්‍රී ලංකාවට දැඩි වියළි කාලගුණයක් බලපවත්වන මාස දෙක නම් කරන්න. (ල. 04)

(iii). ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල වැවෙන ශාක වල ස්වාභාවය එකිනෙකට වෙනස් වීම කෙරෙහි බලපාන සාධක 2ක් නම් කොට එහි බලපෑම පැහැදිලි කරන්න. (ල. 05)

07).

(i). ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම 03 ක් නම් කරන්න (ල. 03)

(ii). ශ්‍රී ලංකාවට සංවහන වර්ෂාව බල පවත්වනු ලබන මාස 4 ලියන්න (ල. 04)

(iii). ශ්‍රී ලංකාව ද්වීපයක් ලෙස පිහිටීමේ වාසි දෙකක් ලියා එය පැහැදිලි කරන්න. (ල. 05)